# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2325/51 - 2023 මාර්තු මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### වයඹ පළාතේ පළාත් සභාව

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ නිවේදනය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරය) 277(1අ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාත් ආණ්ඩුකාරවර අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ වන මවිසින්, කුරුණෑගල මහා නගර සභාවේ නගරාධිපතිවරයා විසින්, සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 277(1) වගන්තියේ සඳහන් වැරදි කිසිවක් සිදු කර ඇත්තේ ද යන්න පිළිබඳව පරීක්ෂාකර මාස තුන (03) ක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2305/12 හා 2022 නොවැම්බර් මස 09 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පත්කරන ලද විශ්‍රාමලත් අධිකරණ නිලධාරී ඒකනායක වීරකෝන් මුදියන්සේලාගේ ලලිත් ඒකනායක මැතිතුමාගෙන් සැදුම්ලත් ඒකපුද්ගල පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා වන පරීක්ෂණ කාලය 2023 අප්‍රේල් මස 10 වන දින සිට 2023 මැයි මස 09 වන දින දක්වා නැවත මසක කාලයකින් දීර්ඝ කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් **වසන්ත කරන්නාගොඩ,**
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2023 මාර්තු මස 29 වන දින,
කුරුණෑගල වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

1A - G 39253 — 07 (2023/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*